SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

## අදියර II විභාගය - 2024 ජනවාරි

## යෝජිත උත්තර

# (203) ව්‍යාපාර නීතිය (BLA)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.
දුරකථන: 011-2-559 669

**මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි**

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2024 ජනවාරි

# (203) ව්‍යාපාර නීතිය

# යෝජිත උත්තර

(මුළු ලකුණු 25)

**A කොටස**

### *පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරː*

**1.1** (4)

**1.2** (3)

**1.3** (4)

**1.4** (2)

**1.5** (2)

**1.6** (2)

*(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 12)*

**1.7** සත්‍යයි

**1.8** සත්‍යයි

**1.9** අසත්‍යයි

*(එක ලකුණු 01 බැගින් මුළු ලකුණු 03)*

**1.10**

- ගිවිසුම අවලංගු කරවා ගැනීම.
- ගිවිසුම තවදුරටත් ඉටුකිරිම ප්‍රතික්ෂේප කිරීම.
- නිශ්චිත ඉටුකිරිමේ ආඥාවක් ඉල්ලා සිටීම
- වාරණ නියෝගයක් ඉල්ලා සිටීම
- හානි සඳහා වන්දි ඉල්ලා සිටීම

**1.11**

| සිවිල් නිතිය | අපරාධ නිතිය |
|---|---|
| සිවිල් වැරදි සම්බන්ධ නඩු කටයුතු සිවිල් අධිකරණවල විසඳනු ලැබේ. | අපරාධ වැරදි සම්බන්ධ නඩු කටයුතු අපරාධ අධිකරණවල විසඳනු ලැබේ. |
| සිවිල් නඩුවක අරමුණ හානියට පත් පුද්ගලයන් යථාවත් කිරිමයි. | අපරාධ නඩුවක අරමුණ අපරාධකරුවන්ට දඬුවම් කිරීමයි. |
| සිවිල් නඩුවක පාර්ශ්ව වන්නේ පැමිණිලිකරු සහ විත්තිකරු ය. | අපරාධ නඩුවක පාර්ශ්ව වන්නේ චෝදක සහ චූදිතය |
| අගතිගාමී පාර්ශවය (පැමිණිලිකරු) විසින් සිවිල් නඩුවක් ගොනු කරනු ලැබේ. ඔහු විසින් පත් කරන ලද නීතිඥවරයෙකු විසින් නඩුව මෙහෙය විය යුතුය. | අගතියට පත් පාර්ශවය වෙනුවෙන් අපරාධ නඩුවක් රජය විසින් ගොනු කරනුලැබේ. අගතියට පත් පාර්ශවය වෙනුවෙන් මහේස්ත්‍රාත් අධිකරණයේදී පොලිසිය විසින්ද සහ මහාධිකරණයේ නීතිපති විසින්ද නඩුව මෙහෙයවනු ලැබේ. |
| සිවිල් නඩුවක් ඔප්පු කිරීමේ භාරය ශක්‍යයතා වැඩිබර මතය. | අපරාධ නඩුවක් ඔප්පු කිරීමේ භාරය සාධාරණ සැකයෙන් ඔබ්බට ය. |
| සිවිල් නඩුවක වරදකරුට වන්දි ගෙවීමට නියෝග කෙරේ. | අපරාධ නඩුවක වැරදිකරුවෙකුට සිරගත කිරීම, දඩ මුදල්, වන්දි හෝ මරණ දඬුවම නියම කෙරේ. |

SRI LANKA

**1.12**

පනතේ ප්‍රධාන පරමාර්ථය වන්නේ මුදල් විශුද්ධිකරණය මර්ධනය කිරීම සහ වැලැක්වීමට අවශ්‍ය පියවර සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ ආනුෂංගික කරුණු පිළිබඳ විධිවිධාන සැලැස්වීම.

**1.13**

- හවුල්කරුවෙකු මානසික නොහැකියාවට පත්වීම
- හවුල්කරුවෙකුට තම හවුල් ගිවිසුමේ වගකීම් ඉටුකල නොහැකි ලෙස පූර්ණ බෙලහීනතාවයට පත්වීම
- හවුල් ගිවිසුම පවත්වාගෙන යාමට බාධාවක් වන හැසිරීමක් සම්බන්ධයෙන් හවුල්කරුවෙකු වරදකරු වන විට.
- හවුල්කරුවෙකු හවුල් ගිවිසුම කඩ කර ඇති අවස්ථාවක
- හවුල් ව්‍යාපාරය දිගින් දිගටම අලාභ ලබන අවස්ථාවක
- හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම යුක්ති සහගත හා සාධාරණ යැයි අධිකරණය සිතන ඕනෑම අවස්ථාවක.

**1.14**

- සමථකරණය
- බේරුම්කරණය
- වාණිජ මණ්ඩලය

***(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 10)***

***(මුළු ලකුණු 25)***

***A කොටසෙහි අවසානය***

## දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

**පරිච්ඡේදය 08 - රක්ෂණ නීතිය, කුලී සින්නක්කර සහ කල්බදු**

**(a)** (අ) මෙම ගැටළුව රක්ෂණ නීතියේ හානිපූර්ණය මූලධර්මය මත පදනම් වේ.

පුද්ගලයෙකුට හෝ ව්‍යාපාරයකට ඔවුන් අත්විඳින හානි හෝ අලාභ සඳහා වන්දි ගෙවීමේ ගිවිසුම්ගත බැඳීමක් ලෙස හානිපූර්ණය අර්ථ දැක්විය හැක. වෙනත් ආකාරයකින් කිවහොත්, රක්ෂණ සමාගමක් රක්ෂණ ඔප්පුහිමියෙකුට සිදුවන්නා වූ රක්ෂණ ගිවිසුම මගින් ආවරණය වන අනතුරකදී හෝ සිදුවීමකදී පූර්ව මූල්‍ය තත්ත්වයට හෝ යථා තත්ත්වයට පත් කිරීමට වන්දි ලබා දීමයි. ඒ අනුව සිදු වූ සැබෑ අලාභයට වඩා මුදලක් රක්ෂණ සමාගම් වන්දි ලෙස ලබා නොදේ.

*Castallain* v. *Preston* යනු ප්‍රශ්නගත කරුණු වලට බෙහෙවින් සමාන තීරණය වූ නඩුවකි. එම නඩුවේදී රක්ෂකයා විසින් ගෙවන ලද වන්දි මුදල ආපසු ලබාගත හැකි බවට තීරණය විය, එසේ නොමැති නම් රක්ෂිතයා රක්ෂණයෙන් ලාභයක් ලබනු ඇත.

එබැවින්, ABC Insurance Ltd හට අදාළ රක්ෂණ මූලධර්මවලට අනුව ඔප්පුව යටතේ ඔවුන් ගෙවූ වන්දි මුදල ආපසු ගිනිගේ මහතාගෙන් ඉල්ලා සිටිය හැක.

SRI LANKA

***(ලකුණු 06)***

**(b)**

යම් දේපලක් රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කර තිබියදී සහ එයට හානියක් සිදුවී ඇත්නම්, නිකුත් කර ඇති සියලුම රක්ෂණ ඔප්පුවල වටිනාකමේ අනුපාතයට එකී සියලුම රක්ෂණ සමාගම් දායක වී වන්දි ගෙවීම දායකත්වය ලෙස හැඳින්වේ.

දායකත්වයේ මූලධර්මය අනුව වන්දි ගණනය කිරීම

වන්දි මුදල = (අදාල රක්ෂණ සමාගම විසින් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පුවේ වටිනාකම / සියලුම රක්ෂණ සමාගම් විසින් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පුවල වටිනාකම) x සිදු වූ අලාභය

***(ලකුණු 04)***

***(මුළු කුණු 10)***

## තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

*පරිච්ඡේදය 04 - නියෝජ්‍යත්ව නීතිය*

**(a)**

- ප්‍රකාශිත එකඟතාවයක් මගින්
- ව්‍යංග එකඟතාවයක් මගින්
- අපරානුමැතියෙන්
- අවශ්‍යතාවය අනුව
- ප්‍රතිබන්ධනය හේතුවෙන්

*(ලකුණු 02)*

**(b)**

**(ආ) භක්ති විසින් දෙන ලද උපදෙස් වලට අනුකූල වීම**

සාමාන්‍ය රීතියක් ලෙස, ප්‍රධානියා ලබාදෙන ලද අසාධාරණ සහ නීති විරෝධී නොවන උපදෙස් ක්‍රියාත්මක කිරීමට නියෝජිතයා බැඳී සිටී. එවැනි අනුගතවීමක් ප්‍රධානියාට අවාසිදායක වුවද ප්‍රධානියාගේ උපදෙස් අනුගමනය කිරීමට නියෝජිතයා බැඳී සිටී.

**නඩු තීන්දු - Turpin V Bilton**

**සැලකිලිමත් වීම**

භක්ති වෙනුවෙන් කටයුතු කිරීමේදී අවංකා නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. අවංකාගේ නොසැලකිල්ල නිසා භක්තිට පාඩුවක් සිදුවුවහොත්, නියෝජිතයා එම පාඩුව ප්‍රධානියාට ගෙවිය යුතුය.

**නඩු තීන්දු - Keppel V Wheeler**

**- ප්‍රධානියාගේ රහස්‍ය තොරතුරු හෙළි නොකිරීම.**

නියෝජිත සබඳතාවයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධානියා සම්බන්ධයෙන් ලබාගත් තොරතුරු වෙනත් පුද්ගලයන්ට හෙළි නොකිරීමට සහ ඒවා තමාගේ ප්‍රයෝජනය සඳහා යොදා නොගැනීමට ඇති යුතුකමයි.

**නඩු තීන්දු - AG V Blake**

**- අවශ්‍ය විට ගිණුම් ඉදිරිපත් කිරීම**

නියෝජිතයා තම කාර්යය ක්‍රියාත්මක කිරීමේදී ආදායම් සහ වියදම් ප්‍රකාශයනක් ප්‍රධානියා වෙත ඉදිරිපත් කල යුතු වේ. කෙසේ වෙතත්, නියෝජිතයා ද්විත්ව සටහන් ක්‍රමයට ගිණුම් පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ.

**- සිය ඇල්ම හා ප්‍රධානියාගේ ඇල්ම අතර ගැටුමක් ඇති වීමෙන් වැලකීම**

නියෝජිතයකුගේ යුතුකම වන්නේ තම ප්‍රධානියාගේ ඇල්ම වෙනුවෙන් ක්‍රියා කිරිම බවත් ඔහුගේ ඇල්ම සඳහා නොවේ. ඒ අනුව, නියෝජිතයා තමා වෙනුවෙන් ගිවිසුම්වලට එළඹිය යුතු නැති අතර ප්‍රධානියා සමඟ තරඟ නොකළ යුතුය.

**නඩු තීන්දු - Armsstron V Jackson**

**- අධිකාරි බලතල නොපැවරීය යුතුය**

මෙම යුතුකම පෙන්නුම් වන්නේ 'delegare' හි ලතින් ආප්තය මත වන අතර එය ඉංග්‍රීසියෙන් කියවෙන්නේ "බලය පවරනු ලබන තැනැත්තාට එම බලය තවදුරටත් පැවරිය නොහැක" යනුවෙනි. ඒ අනුව ම ප්‍රධානියාගේ කාර්යයන් ඉටු කිරීම සඳහා උප නියෝජිතයන් පත් නොකර පුද්ගලික සේවයක් කිරීමට නියෝජිතයෙකු බලාපොරොත්තු වේ.

**නඩු තීන්දු - Jhon McCann & Col V Paw**

**- රහස් ලාභ හෝ අල්ලස් නොගැනීම**

ප්‍රධානියා වෙනුවෙන් ක්‍රියා කරන අතරතුර රහසිගත ලාභ නොලබන වගකීමක් නියෝජිතයෙකු සතුව පවතී.

- **නියෝජිතායතනය අවසන් කරන අවස්ථාවේදී, නියෝජිතයා ඔහු සන්තකයේ ඇති සියලුම ප්‍රධානියාගේ වත්කම් සහ ලේඛන ආපසු ලබා දිය යුතුය.**

***(ලකුණු 04)***

**(c)**

නියෝජිතයෙකුගේ ප්‍රධාන යුතුකම් වලින් එකක් නම්, නියෝජිතයා ප්‍රධානියාගේ උපදෙස් අනුගමනය කළ යුතු අතර නියෝජිතයා ඔහුට පවරා ඇති අධිකාරිය ඉක්මවා නොයා යුතුය. එවැනි උපදෙස් වලට අනුකූල නොවීම නිසා ප්‍රධානියාට ඇතිවන අලාභ නියෝජිතයා විසින් පුද්ගලිකව දැරිය යුතු වේ.

***<u>Turpin</u> V <u>Bilton</u>***

මෙහිදී ප්‍රධානියාට අයත් යාත්‍රාවක් රක්ෂණය කිරීමට නියෝජිතයෙකුට බලය පවරන ලදී. එහෙත් නියෝජිතයා එම උපදෙස් අනුව කටයුතු නොකිරිම නිසා යාත්‍රාව රක්ෂණය කර නැත. නැව මුහුදේදී විනාශ විය. ප්‍රධානියාට සිදු වූ පාඩුවට නියෝජිතයා විසින් වන්දි ගෙවිය යුතු බව අධිකරණය තීන්දු කළේය.

ලබා දී ඇති සිදුවීම තුළ, ප්‍රදර්ශනය කරන ලද මිලෙන් 75% ට අඩුවෙන් කිසිදු ඇඟලුමක් අලෙවි නොකරන ලෙසත්, කිසිදු හේතුවක් යටතේ වෙළඳසැල සඳහා කිසිදු තොගයක් මිලදී නොගන්නා ලෙසත් අවංකා (නියෝජිතයා) වෙත උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත්, අවංකා සීමාසහිත සළුසල සමාගම වෙත සාරි අලෙවි කළේ ප්‍රදර්ශනය කරන ලද මිලෙන් 70% කට ය. බලාපොරොත්තු වූවාට වඩා ඉක්මනින් සරම් තොගය අවසන් වූ නිසා අවංකා දේශීය සැපයුම්කරුවෙකුගෙන් බතික් සරම්

100ක් මිලදී ගෙන ඇත. එමනිසා, අවන්කා විසින් ලබා දී ඇති උපදෙස් අභිබවා කටයුතු කර ඇති බවත් නියෝජිතයෙකු ලෙස ඇයගේ යුතුකම් කඩ කර ඇති බව පෙනී යයි. එහෙයින් අවංකා නියෝජිතයෙකු ලෙස කරන ලද යම් ක්‍රියාවක් නිසා හක්තිට අලාභයක් සිදුවී ඇත්නම් නම් එම අලාභය අවන්කා විසින් දැරිය යුතුය.

***(ලකුණු 04)***
***(මුළු ලකුණු 10)***

## *හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 10 - ව්‍යාපාරික පරිසරයට අදාල වැරදි***

**(a)**

- පාරිභෝගිකයන්ගේ ජීවිතවලට හා දේපළවලට හානි සිදුවන භාණ්ඩ අලෙවිකරණයෙන් හෝ සේවා සැපයීමෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.
- අසාධාරණ වෙළෙඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා නිසි අවධානයට ලක් කළ යුතු බවට සහතික වීම.
- හැකි සෑම අවස්ථාවකදීම පාරිභෝගිකයින්ට තරඟකාරී මිල ගණන් යටතේ භාණ්ඩ හා සේවා සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් ඇති බව සහතික කිරීම.
- අසාධාරණ වෙළෙඳ පරිචයන්, තහනම් කරන ලද වෙළෙඳ පරිචයන් හෝ වෙළෙඳුන් විසින් පාරිභෝගිකයන් සූරාකෑමට ලක්කරන ඕනෑම ආකාරයක වෙළෙඳ පරිචයන්ට එරෙහිව කටයුතු කර හානි අයකරගැනීම.

SRI LANKA

***(ලකුණු 04)***

**(b)**

ලබා දී ඇති සිදුවීම පාරිභෝගික ආරක්ෂණ නීතිය සමඟ එක්ව විශ්ලේෂණය කළ යුතුය. ලබා දී ඇති කරුණු පිරික්සීමේදී පෙනී යන්නේ අවම මිලක් පැනවීමේ අවාසිය මඟහරවා ගැනීමට සහ වෙළඳපොලේ සහල් හිඟය මවා පෑමට සඳුන් ගබඩාවේ සහල් තොග සඟවා ඇති බවයි.

2003 අංක 09 දරණ 2003 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පනතේ 16 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකාව තුළ වෙළඳාම් කිරීම සඳහා කිසියම් භාණ්ඩයක් ඔහු සන්තකයේ හෝ භාරයේ හෝ ඔහුගේ පාලනය යටතේ ඇති කිසිදු වෙළෙන්දෙකු එවැනි භාණ්ඩ සම්බන්ධයෙන් සන්තකය ප්‍රතික්ෂේප නොකළ යුතුය.

සඳුන් ස්ටෝර්ස් විසින් තමන් සතුව ඇති තොග සඟවා එම භාණ්ඩ නොමැති බව ප්‍රකාශ කර වෙළෙඳ පොළේ සහල් හිඟයක් මවාපෑමෙන් මිල පාලනයෙන් මිදීමට උත්සහ දරයි නම් නම් එය ඉහත පනත යටතේ අපරාධමය වරදක් බවට පත්වේ.

මයුරට මේ සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු අධිකාරියට පැමිණිලි කළ හැකි අතර පරීක්ෂණයකින් පසු අධිකාරිය සඳුන් ස්ටෝර්ස් ව්‍යාපාරයට එරෙහිව නීතිමය පියවර ගනු ඇත.

***(ලකුණු 06)***
***(මුළු ලකුණු 10)***

## *පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

| |
|---|
| ***පරිච්ඡේදය 05 - සමාගම් නීතිය***<br>***පරිච්ඡේදය 06 - ගනුදෙනු කල හැකි ලියවිලි*** |

**(a)**

- සංස්ථාපිත පුද්ගලභාවය සංකල්පය භාවිතා කරමින් සිදු කරන ලද වංචා නඩු වලදී
- ජාතික හදිසි අවස්ථා වලදී
- බදු ගෙවීම් පැහැර හැරීමේදී
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අධ්‍යක්ෂවරුන් සතු යුතුකම කඩ කරන අවස්ථා වලදී
- වස්තු භංගත්වය පිළිබඳව අධ්‍යක්ෂවරුන් සතු යුතුකම කඩ කරන අවස්ථා වලදී

***(ලකුණු 04)***

**(b)**

*Wilson and Meeson* v *Pickering* යනු ගනුදෙනු කල නොහැකි යන රේඛනයේ කිරීමේ බලපෑම විශ්ලේෂණය කළ සුප්‍රසිද්ධ නඩු තීන්දුවකි, එහි නීතිමය මූලධර්ම ප්‍රශ්නගත සිදුවීමට ආදේශ කළ හැකිය.

*Wilson and Meeson* v *Pickering* නඩුවේදී, "A" විසින් චෙක්පතක් හිස්ව අත්සන් කර චෙක්පතේ මුහුණේ "ගනුදෙනු කළ නොහැකිය " ලෙස සඳහන් කරන ලදී. ඉන් අනතුරුව මාසික විදුලි බිල ගෙවීමට අවශ්‍ය තොරතුරු පුරවන ලෙස ලේකම්වරයාට එය භාරදෙන ලදි. ලේකම්වරයා "C" ගෙන් මුදල් ණයට ගෙන ඇති අතර එම නිසා ණයට ගත් ණය මුදල පියවීමට ලේකම්වරයා අවශ්‍ය තොරතුරු පුරවා "C" ට දුන්නේය. මේ ගැන දැනගත් "A" චෙක්පතේ ගෙවීම ප්‍රතිනියෝග කරන ලදී. චෙක්පතේ ලියා ඇති "ගනුදෙනු කළ නොහැකි" යන වාක්‍යය නිසා චෙක්පතේ ගනුදෙනු කිරීමේ හැකියාව බැහැර කර ඇති අතර එම නිසා "C" ට ලේකම්වරයා සතුව තිබූ දෝෂ සහිත අයිතියම ලැබෙන බව අධිකරණය තීරණය කළේය. ඒ අනුව "C" යථාකාල ධාරකයෙකු නොවේ. ඒ අනුව, චෙක්පතේ දක්වා ඇති වටිනාකම ලබා ගැනීමට "C" ට නීත්‍යානුකුල අයිතියක් නොමැති බව අධිකරණය තීරණය කළේය.

ඒ හා සමානව, මේ කාරණයේදී මනීෂාට චෙක්පත මුදල් කිරීමට නීත්‍යානුකුල අයිතියක් නැත. චෙක්පත බැංකුවට ඉදිරිපත් කළ විට මනීෂාට චෙක්පත ලැබුණු ආකාරය සහ චෙක්පත සම්බන්ධයෙන් මනීෂාට ඇති අයිතිය සොයා බැලීම බැංකුවට වගකීමක් තිබේ. මනීෂාට සුමුදුගෙන් ලැබුණේ දෝෂ සහිත චෙක්පතකි. කරුණු තහවුරු කර ගැනීමෙන් පසු චෙක්පත ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට බැංකුවට අභිමතය ඇත.

***(ලකුණු 06)***

***(මුළු ලකුණු 10)***

aat SRI LANKA

## හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ

| පරිච්ඡේදය 07 - කම්කරු නීතිය |
|---|

**(a)** මධුෂා Content.lk හි සේවකයෙක්ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා කම්කරු නීතිය මගින් හඳුනාගත් විවිධ පරීක්ෂණ සිදු කළ යුතුය. ලබා දී ඇති කරුණු මත පදනම්ව, පහත පරීක්ෂණ සිදු කිරීමෙන් නිගමනයකට එළඹිය හැකිය.

**පාලන පරීක්ෂණය**
යම් පුද්ගලයෙකු යම් සේවාවක් සැපයීමේ නිරතව සිටින අතරතුර සේවා යෝජකයෙකුට විනය පාලනය කළ හැකි විට ඔහු සේවකයෙකු ලෙස හඳුනා ගැනේ. විනය යන්නෙන් අදහස් කරන්නේ සේවයට පැමිණිය යුතු වේලාව , නිවාඩු, සේවකයා විසින් ඉටු කළ යුතු කාර්යයන්, විවේකයන්, සේවය අවසන් කරන කාලය, සේවකයින්ගේ උසස්වීම් සහ පහල දැමීම් නියාමනය කිරීමයි.
මධුෂා අයිතිකරුගේ දන්නා හඳුනන ඥාතිවරියකි, ඇය Content.lk සමඟ කිසිදු ගිවිසුමක් අත්සන් කර නැත. මධුෂා දිනපතා කාර්යාලයට පැමිණ නැත. ඇය නිවසේ සිට වැඩ කර ඇත. එබැවින් Content.lk හට මධුෂා පාලනයක් නැති බව පෙනේ.

**උපකරණ පිළිබඳ පරීක්ෂණය**
සේවා සැපයීම සඳහා අවශ්‍ය උපකරණ සේවායෝජකයා විසින් සපයනු ලබන අවස්ථාවකදී ඔහු සේවකයෙකු ලෙස සලකනු ලැබේ.
මධුෂා තම මුදලින් මිලදී ගත් තමාගේම ලැප්ටොප් පරිගණකයක් සහ ග්‍රැෆික් නිර්මාණ මෘදුකාංගයක් ඇය විසින් භාවිතා කර ඇත.

**ඒකාබද්ධ පරීක්ෂණය**
සේවකයෙකු ව්‍යාපාරයෙන් වෙන් කළ නොහැකි ආකාරයෙන් ව්‍යාපාරයට සම්බන්ධ වී ඇත්නම් හෝ ව්‍යාපාරයේ කොටසක් ලෙස සලකන්නේ නම්, ඔහු ව්‍යාපාරයේ සේවකයෙකු ලෙස සැලකේ. එනම්, එම පුද්ගලයා විසින් ව්‍යාපාරයට සපයන සේවාව සහාය සේවාවක් නොවිය යුතු අතර එය ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යයක් විය යුතුය.
මධුෂා ව්‍යාපාරයට වෙන් කළ නොහැකි ආකාරයට සම්බන්ධ නැති බව පෙනේ. ඇය සපයන්නේ ග්‍රැෆික් නිර්මාණ සේවාව පමණි.

**ආර්ථික සත්‍යතා පරීක්ෂණය**
මෙම පරීක්ෂණයට අනුව, පුද්ගලයෙකු තමා වෙනුවෙන් සේවය කරන්නේ නම්, එයින් අදහස් වන්නේ අවසාන සෘජු ප්‍රතිලාභය ඔහුට හිමිවේ නම්, ඔහු ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු වන අතර අවසාන ප්‍රතිලාභය සේවා සපයන සමාගමට හිමිවේ නම්, ඔහු සේවකයෙකි. මධුෂා සෑම විටම ඇයගේ සේවාවන් සඳහා මිල ගණන් සඳහන් කරනු ලබයි.

ඉහත පරීක්ෂණ අනුව මධුෂා Content.lk හි සේවකයෙකු නොවන බව නිගමනය කළ හැක.

***(ලකුණු 06)***

**(b)**

- විශ්‍රාම යන වයසට එළඹීමේදී
- විවාහය නිසා කාන්තාවක් සේවයෙන් ඉවත්ව යාම
- සම්පූර්ණ ආබාධිත තත්ත්වය හේතුවෙන් රැකියාව නතර කිරීම
- ස්ථිර පදිංචිය සඳහා විදේශ රටකට පිටත් වීම
- රජයේ හෝ පළාත් පාලන සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් සඳහා පත් කළ විට
- මෙහි අරමුදලේ සාමාජිකයෙකුගේ මරණයකදී සාමාජිකයා විසින් නම් කරන ලද පුද්ගලයෙකුට ප්‍රතිලාභ ලබා ගත හැක.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

| ***B* කොටසෙහි අවසානය** |
| --- |

## *හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තරඃ*

***පරිච්ඡේදය 03 - භාණ්ඩ විකිණීමේ නීතිය***

**(A)**

**(a)**

- විකුණුම්කරුට විකුණන ලබන භාණ්ඩ විකිණීමට අයිතියක් තිබිය යුතුය.
- භාණ්ඩ විස්තරයක් අනුව විකුණන්නේ නම් විකුණන ලබන භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතුය.
- සපයනු ලබන භාණ්ඩ එම කාර්යය සඳහා සුදුසු විය යුතුය.
- භාණ්ඩ වෙළඳ තත්ත්වයේ තිබිය යුතුය
- නියැදි මඟින් භාණ්ඩ විකුණනු ලබන විට, භාණ්ඩ නියැදිය සමඟ අනුකූල විය යුතුය.

***(ලකුණු 03)***

**(b)**

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ප්‍රධාන අංගය වන්නේ විකිණුම්කරුගෙන් ගැනුම්කරුට භාණ්ඩයක අයිතිය මාරුවීමයි. කෙසේ වෙතත්, අයිතිය මාරුවීම වර්තමාන අයිතිය හෝ අනාගතය අයිතිය විය හැකිය.

ගිවිසුමකට ඇතුල් වූ වහාම භාණ්ඩයක අයිතිය විකුණුම්කරුගෙන් ගැනුම්කරුට මාරු වේ නම්, එවැනි ගිවිසුමක් "විකිණුම් ගිවිසුම" ලෙස හැඳින්වේ.

ගිවිසුමට ඇතුලත් වූ පසු දිනකදී භාණ්ඩයක අයිතිය විකුණුම්කරුගෙන් ගැණුම්කරුට පැවරීමට අදහස් කරන්නේ නම්, එය 'විකිණීමට එකඟවීමක් ' ලෙස අර්ථ දැක්වේ. යම් ගිවිසුමක්, විකිණීමේ ගිවිසුමක්ද නැතහොත් භාණ්ඩ විකිණීමට එකඟවීමක් ද යන්න පාර්ශවයන්ගේ හැසිරීම, එක් එක් සිද්ධියේ කරුණු සහ පාර්ශවයන්ගේ චේතනාව මත රඳා පවතින බව අධිකරණය විසින් විනිශ්චය කොට ඇත.

භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් තුළ, විකුණුම්කරු ගිවිසුම කඩ කර ඇති විට, ගැනුම්කරුට විකුණුම්කරුට එරෙහිව සහ භාණ්ඩයට එරෙහිව ප්‍රතිකර්ම ඇත. එසේ වුවද, භාණ්ඩ විකිණීමට එකඟ වූ ගිවිසුමක් කඩ කර ඇති අවස්ථාවකදී,ගැනුම්කරුට පවතින්නේ විකුණුම්කරුට එරෙහිව ප්‍රතිකර්ම පමණි.

නඩු තීන්දු - <u>Jayasena Perera</u> V <u>Ratnadasa</u>

***(ලකුණු 05)***

**(c)**

මෙය භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ ව්‍යංග කොන්දේසි මත පදනම් වේ. භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ 14 වැනි වගන්තියට අනුව, විස්තරය අනුව භාණ්ඩ විකිණීමක් තිබේ නම්, විකුණන ලද භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතුය. බෙදා හරින ලද භාණ්ඩ සහ ඒවායේ විස්තරය අතර ඇති සුළු නොගැලපීම් හේතුවෙන් පවා භාණ්ඩ ප්‍රතික්ෂේප කිරීමට ගැනුම්කරුට අයිතිය ඇත.

නඩු නීති -

***Beale* V *Taylor***

***Moore* V *Landaure***

***Acros Ltd* V *Ronaason Sons***

Beale V Taylor සම්බන්ධයෙන් ගත් කල, ට්‍රයිම්ප් හෙරල්ඩ් 1200 (1961 සාදන ලද) වර්ගයේ මොටර් රථයක් පුවත්පතක ප්‍රචාරය කරන ලද දැන්වීමක් මගින් විකුණා ඇත. මිලදී ගැනීමෙන් පසු එම වාහනය ට්‍රයම්ෆ් හෙරල්ඩ් 1200 එකක් නොවන බව ගැනුම්කරුට දැනගන්නට ලැබිණි. ඒ අනුව එම භාණ්ඩ විස්තරයට අනකූල විය යුතුය යන ව්‍යංග කොන්දේසි උල්ලංඝනය කර ඇති බවට අධිකරණය තීරණය කරන ලදි.

ඩීල් මහතා විසින් අලෙවි කරන ලද සුඛෝපභෝගී රේසිං මෝටර් රථය ඔහුගේ විස්තරය සමඟ නොගැලපේ, මන්ද එය "1976 මාදිලියේ "C" කළු වර්ණ" මෝටර් රථය නොවේ. ඒ නිසා ඩීල් මහතා භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ව්‍යංග කොන්දේසි කඩකර ඇත. එහිදී කීල්ස් මහතාට විකුණුම්කරුට එරෙහිව ගැනුම්කරුවෙකුට ලබා ගත හැකි ප්‍රතිකර්ම සක්‍රිය කළ හැකිය. කීල්ස් මහතාට ඩීල් මහතාගෙන් ඔහුගේ මුදල් ආපසු ඉල්ලා සිටිය හැක.

SRI LANKA

***(ලකුණු 07)***

***පරිච්ඡේදය 02 - ගිවිසුම් නීතිය***

**(B)**

**(a)**

**(අ)** සාමාන්‍ය රීතියක් ලෙස, බාල වයස්කරුවන් ගිවිසුම් ශක්නුතාවයකින් තොර පාර්ශ්වයන් ලෙස පිළිගනු ලබන අතර, ඔවුන් විසින් එළැඹුණු ගිවිසුම් වලංගු ගිවිසුම් ලෙස නොසැලකේ. බාලවයස්කරුවන් යනු වයස අවුරුදු 18 ට අඩු අයයි. ඒ අනුව 17 හැවිරිදි නයනි ඇතිකරගත් ගිවිසුම බාලවයස්කාරයකු විසින් ඇතිකරගත් ගිවිසුමක් ලෙස හඳුනාගත හැකිය. කෙසේ වෙතත්, බාල වයස්කරුවෙකු විසින් ඇති කර ගන්නා ලද බාලයාට ප්‍රතිලාභ සලසන්නා සේවා ගිවිසුම් ඉහත රීතියට ව්‍යතිරේකයකි. ගිවිසුමක් මගින් බාලවයස්කාරයා බාල වයස්කරුවන්ගේ අනාගත ජීවිත ගැලපීම සඳහා අවශ්‍ය අධ්‍යාපනය, පුහුණුව, ආධුනිකත්වය හෝ රැකියාවක් සඳහා සූදානම් කරවන්නේ නම් බාලවයස්කරුවා එයට බැඳී ඇත.

***AG* V *Costa***

බාල වයස්කරුවෙකු වසර තුනක කාලයක් ගුරු අභ්‍යාස විද්‍යාලයක පුහුණුව ලැබීමට කොන්ත්‍රාත්තුවක් ලබාගෙන ඇති අතර පුහුණුව අවසන් වූ පසු වසර පහක කාලයක් රජයේ පාසලක

සේවය කිරීමට එකඟ වී ඇත. පුහුණුව අවසන් කළ බාලවයස්කාර දැරිය රජයේ පාසලක සේවය කිරීම ප්‍රතික්ෂේප කළේය. බාලවයස්කරුගේ ප්‍රතිලාභ සලසන්නා සේවා ගිවිසුමක් බැවින් බාලවයස්කාරයා සහය නොලබන ගිවිසුමකින් බැඳී සිටින බව උසාවිය තීරණය කළේය.

මෙහිදීද නයනි උසස් මට්ටමේ පියානෝ පාඩම් හැදෑරීමට ශාන්ති ඇකඩමිය සමඟ ගිවිසුමකට එළඹුණාය. එය ඇයගේ සංගීත කුසලතා වර්ධනය කරන ඇයගේ අනාගත දියුණුව සඳහා වූ ගිවිසුමක් ලෙස සැලකිය හැකිය. ඒ අනුව නයනි බාලවයස්කාරියක් වුවද ඇය විසින් ඇතිකරගත් ගිවිසුම ඇය විසින් ඇතිකරගත් බන්ධනීය ගිවිසුමක් ලෙස හඳුනාගත හැකිය.

***(ලකුණු 06)***

**(b)**

■ ගිවිසුමට ඇතුල් වීමෙන් පසුව මුක්ත වගන්ති හඳුන්වා දෙනු ලැබේ නම් එය වලංගු නොවේ.

නඩුව: ***Olley V Marlborough court***

■ ගිවිසුමට ඇතුලත් වන අවස්ථාවේදී සාධාරණ ලෙස ප්‍රමාණවත්ව මුක්ත වගන්තිය අනෙක් පාර්ශ්වයට සන්නිවේදනය කර නොමැති නම් එය වලංගු නොවේ.

නඩුව: ***Chapelton V Barry UDC***

■ ගිවිසුම මගින් අවනිදේශනයක් සිදුව ඇති අවස්ථාවක

නඩුව: ***Curtis v chemical Cleaning Company***

■ 1997 අංක 26 දරන අසාධාරණ ගිවිසුම් නියම පනතට මගින්, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් මුක්ත වගන්තිවලට නීතියේ බලපෑමක් නැත.

- ගිවිසුමේ මූලික හරය සම්බන්ධයෙන් වගකීම් ව්‍යවනය කිරීම සඳහා වන වගන්ති.
- නොසැලකිලිමත්කමේ ප්‍රතිඵලයක් ලෙස සිදුවන මරණයක් හෝ පුද්ගල හිංසනයක් සම්බන්ධ වූ වගකීම බැහැර කිරීම සඳහා වන වගන්ති.
- භාණ්ඩ විකිණීමේ හෝ බෙදා හැරීමේ ගිවිසුමේ දී, පාරිභෝගිකයින් විසින් භාණ්ඩ පරිභෝජනයෙන් ඇති විය හැකි අලාභය සඳහා වගකීම බැහැර කිරීම සඳහා වන වගන්ති.
- භාණ්ඩ විකුණුම් ආඥාපනත සහ පාරිභෝගික ණය පනත යටත මගින් විකුණුම්කරුට පවරා ඇති වගකීම් බැහැර කිරීම සඳහා වන වගන්ති.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 25)***

***C කොටසෙහි අවසානය***

***Notice:***

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers". The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

SRI LANKA

*© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*